# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## ඇබෑර්තු

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පහත දක්වා ඇති පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙතින් 2026.09.23 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු :** **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I / II ශ්‍රේණිය / කථිකාචාර්ය (තහවුරු නොකළ) / කථිකාචාර්ය (පරිවාස)**

**සුදුසුකම් :** වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයෙහි නිල වෙබ් අඩවිය වන (https://gwu.ac.lk/) පරිශීලනය කරන්න.

| අධ්‍යනාංශය | | විශේෂීකරණය වූ ක්ෂේත්‍ර | වෙනත් කරුණු |
|---|---|---|---|
| **දේශීය සමාජීය විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය** | | | |
| 01 | දේශීය සමාජීය විද්‍යා අධ්‍යයන අංශය | මානව විද්‍යාව (Anthropology)<br>සමාජ විද්‍යාව (Sociology)<br>භූගෝල විද්‍යාව (Geography) | ප්‍රථම හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිත ශාස්ත්‍රවේදී (BA) විශේෂ / ගෞරව උපාධියක් හෝ සමාජ අධ්‍යයනය (දේශීය දැනුම) පිළිබඳ විද්‍යාවේදී (BSc) ගෞරව උපාධියක් පැවතීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය (PhD) උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. |
| **දේශීය සෞඛ්‍ය විද්‍යා හා තාක්ෂණ පීඨය** | | | |
| 01 | දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය | ඖෂධවේදය (Pharmacology), ඖෂධ තාක්ෂණය (Pharmaceutical Technology), ඖෂධ තත්ත්ව තහවුරු කිරීම (Pharmaceutical Quality Assurance), රෙගුලාසි සහ නීතිය (Regulations & Law), ඖෂධ ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ විෂ විද්‍යාව.<br>Drug Safety, efficacy and Toxicology) | ඖෂධවේදය පිළිබඳ විද්‍යාවේදී (BSc in Pharmacy හෝ ඖෂධවේද (B. Pharm) ප්‍රථම හෝ දෙවන පන්තියේ විශේෂ / ගෞරව උපාධියක් පැවතීම)<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය (PhD) උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. |
| | | ඖෂධීය ශාක වගාව සහ වාණිජකරණය (Medicinal Plant Cultivation and Commercialization), ඩිජිටල් කෘෂිකර්මාන්තය (Digital Agriculture), ස්මාර්ට් ගොවිතැන් තාක්ෂණය (Smart Farming Technologies), දේශගුණික සහ හරිත මූල්‍යකරණය (Climate & Green Financing) සහ කෘෂි ව්‍යාපාර (Agribusiness) | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී (BSc in Agriculture) හෝ කෘෂිකාර්මික තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (BSc in Agricultural Technology & Management) ප්‍රථම හෝ දෙවන පන්තියේ විශේෂ ගෞරව උපාධියක් පැවතීම<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය (PhD) උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. |
| | | ඖෂධීය සම්පත් පිළිබඳ බහු විද්‍යාවන්, කෘෂි - ජෛව තොරතුරු තාක්ෂණය, ජෛව තාක්ෂණය සහ පරිගණක ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, කාබනික ගොවිතැන, භෝග විද්‍යාව, කෘෂි පරිසර විද්‍යාව. | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී හෝ කෘෂිකාර්මික තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ප්‍රථම හෝ දෙවන පන්තියේ විශේෂ / ගෞරව උපාධියක් පැවතීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය (PhD) උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. |
| 02 | දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය | යෝග ආසන ප්‍රායෝගික (මූලික සිට උසස් මට්ටම දක්වා) යෝග ආසනවල චිකිත්සක භාවිතය, උසස් ප්‍රාණයාම, භාවනා සහ සිහිය පවත්වා ගැනීමේ අභ්‍යාස | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී (BAMS) උපාධියක් හෝ යෝග ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම හෝ දෙවන පන්තියේ උපාධියක් ලබා තිබීම.<br>ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අනිවාර්ය වේ.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ ආචාර්ය (PhD) උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.<br>යෝග ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික අද්දැකීම් අනිවාර්ය වේ.<br>යෝග ආසන මූලික මට්ටමේ සිට උසස් මට්ටම දක්වා යෝග ආසන සිදු කිරීම සහ ඉගැන්වීමේ විශේෂඥ දැනුම පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. |
| | | ව්‍යුහ විද්‍යාව සහ කායික විද්‍යාව, ආයුර්වේද මූලධර්ම සහ චිකිත්සක භාවිතය, ස්වාභාවික වෛද්‍ය විද්‍යාව, ස්වස්ථවෘත්ත, පංචකර්ම, චිකිත්සක භාවිතය, ආයුර්වේද ආහාර විද්‍යාව සහ පෝෂණය. | ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී (BAMS) ප්‍රථම හෝ දෙවන පන්තියේ උපාධියක් තිබිය යුතුයි.<br>ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අනිවාර්ය වේ.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය (PhD) උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. |
| | | සංචාරක කළමනාකරණය, ආගන්තුක සත්කාර කළමනාකරණය, සෞඛ්‍ය සංචාරක ව්‍යාපාරය, සෞඛ්‍ය සේවා කළමනාකරණය, සෞඛ්‍ය ආර්ථික විද්‍යාව සෞඛ්‍ය සේවා කළමනාකරණය. | ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය / ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය / විද්‍යාවේදී (සංචාරක කළමනාකරණය / ආගන්තුක සත්කාර කළමනාකරණය / උත්සව කළමනාකරණය) පිළිබඳ ප්‍රථම හෝ දෙවන පන්තියේ උපාධියක්.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය (PhD) උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. |

**වැටුප් පරිමාණය**

අ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, I ශ්‍රේණිය : රු. 160,520-7 X 3,900 - 187,820 (මාසික) [U-AC 3(I)] අදාළ වැටුප් පරිමාණයේ රු. 160,520/- (මාසික) මූලික පියවරෙහි පිහිටවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 116% + රු. 2,200/- ක් ගෙවනු ලැබේ.

ආ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, II ශ්‍රේණිය : ශ්‍රේණිය : රු. 138,980 - 11 X 2,940 - 171,320 (මාසික) [U-AC 3(II)] අදාළ වැටුප් පරිමාණයේ රු. 138,980/- (මාසික) මූලික පියවරෙහි පිහිටවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 116% + රු. 2,100/- ක් ගෙවනු ලැබේ.

ඇ) කථිකාචාර්ය (තහවුරු නොකළ) : රු. 121,340 - 5 X 2,940 - 136,040 (මාසික) [U-AC 3(III)] අදාළ වැටුප් පරිමාණයේ රු. 121,340/- (මාසික) මූලික පියවරෙහි පිහිටවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 116% + රු. 1,800/- ක් ගෙවනු ලැබේ.

ඈ) කථිකාචාර්ය (පරිවාස) : රු. 94,400 - 10 X 2,400 - 118,400 (මාසික) [U-AC 3(IV)] අදාළ වැටුප් පරිමාණයේ රු. 94,400/- (මාසික) මූලික පියවරෙහි පිහිටවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 91% + රු. 1,200/- ක් ගෙවනු ලැබේ.

- ➢ 2025.04.01 දිනැති අංක 02/2025 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූලව වැටුප් සහ අධ්‍යයන දීමනා ගෙවනු ලැබේ.
- ➢ තෝරාගනු ලබන අයදුම්කරුවන්ට ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව සහ වෙනත් අනුමත දීමනා ගෙවනු ලැබේ.
- ➢ ඉහත සඳහන් අනුපාත රජයේ රෙගුලාසීන්ට අනුකූලව වෙනස් විය හැක.

**ප්‍රතිලාභ**

- ➢ තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට දායක වන අතර, විශ්වවිද්‍යාලය ඔවුන්ගේ වැටුපෙන් 15% ක දායකත්වයක් ලබා දෙන අතර, එය 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට සහ 7% විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට බැර කෙරේ. ඊට අමතරව ඔවුන් සේවක භාර අරමුදලට දායකත්වය දක්වන අතර, ඊට වැටුපෙන් 3% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලය මගින් ලබා දෙනු ලැබේ.
- ➢ 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනතේ විධි විධානයන්ට අනුකූලව පාරිතෝෂිත ගෙවීම සිදු කෙරේ.
- ➢ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) හෝ ඉන් ඉහළ තනතුරු දරන්නන්ට සම්පූර්ණ වැටුප් සහිත එක් අවුරුදු සප්තවාර්ෂික නිවාඩු හෝ අවුරුදු දෙකක වැටුප් රහිත නිවාඩු සඳහා වසර 7 ක සේවා කාලය අවසානයේ සුදුසුකම් ලබනු ඇත. මෙම සප්ත වාර්ෂික නිවාඩුව එතෙර ගතකරන විට ඒ සඳහා ගුවන් ගමන් ගාස්තු ලබා ගැනීමේ හිමිකම අයදුම්කරුට හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

- ➢ නිර්දේශිත අයදුම්පත සහ සුදුසුකම් (UGC චක්‍රලේඛ අංක 721 සහ එහි සංශෝධනවලට අනුව ඇතුළු වැඩිදුර තොරතුරු සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ (https://gwu.ac.lk/) ඇති විස්තර පත්‍රිකා පරීක්ෂා කළ යුතුය. විමසීම් සඳහා නියෝජ්‍ය ලේඛකාධිකාරී අධ්‍යයන ආයතන අංශය වෙත මේ මගින් සම්බන්ධ විය හැකිය. (0332215827 / drae@gwu.ac.lk)
- ➢ අයදුම්පත් මාර්ගගත ක්‍රමයට එවිය යුතුය. අයදුම්පත පුරවා, ඊට අදාළ සියලුම ලේඛන (අයදුම්පත සහ ඔබේ සහතිකවල සහතික කළ පිටපත්) නිල මාර්ගගත ද්වාරය (Online portal) වෙත කෙළින්ම උඩුගත කරන්න. සටහන : ඔබ අයදුම් කරන එක් එක් තනතුර සඳහා වෙන වෙනම මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- ➢ දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය. ආයතනික මට්ටමේ ප්‍රමාදයක් සිදුවන අවස්ථාවකදී, සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා අයදුම්පතේ ප්‍රගමන පිටපතක් නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.
- ➢ බාගත කරගත් අයදුම්පත මුද්‍රණය කර, ඊට අත්සන් තබා, අවශ්‍ය නිල මුද්‍රා, (rubber stamps) තබා එම මුද්‍රිත පිටපත සහ ඔබගේ සහතිකවල සහතික කළ පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය.

  **නියෝජ්‍ය ලේඛකාධිකාරී,**

  **අධ්‍යයන ආයතන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, නුවර පාර, යක්කල.**
- ➢ ලියුම් කවරයේ ඉහළ වම් පස කෙළවරේ "අයදුම් කරන තනතුරේ නම" පැහැදිලිව සඳහන් කළ යුතුය.
- ➢ මාර්ගගතව (Online) ඉදිරිපත් කරන අයදුම්පත සහ දෘඩ පිටපත 2026 සැප්තැම්බර් 23 වන දින හෝ ඊට පෙර විශ්වවිද්‍යාලය වෙත එවිය යුතුය. අසම්පූර්ණ, ප්‍රමාද වී ලැබෙන හෝ නිසි ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.**
**නුවර පාර, යක්කල.**
**2026 අගෝස්තු 25**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED